# අනන්තය

ආචාර්ය
වික්‍රමබාහු
කරුණාරත්න



**කොහොම වුණත් සිදුහත් - යසෝදරා ප්‍රේමය මෙලෙසට බුදුන් හා යසෝදරා ථෙරණිය ලෙසට සංඝ සභාව තුළත් නිෂේධ වුණා කියලත්, එසේම උතුම් බැම්මකට යළි ඇතුල් වුණා කියලත් කියන්න පුළුවන්. මට හිතුනේ මේ ගැටලු මේ තිලක් ගේ කථාව තුළින් දැඩි ලෙස මතු වෙනව කියලයි. තෘෂ්ණාව මුල් වූ ආදරය තුළින් කටුක අත්දැකීමකට සාරධ මුහුණ දෙනව. ඔහු තම සිත තුළ අරගල කරන්නේ ආත්මාර්තකාමී නොවී සාමූහික ආදරයකින් සමාජය සමඟ ජීවත් වෙන්න. ඒත් එයින් ඔහුට ඇති වුණේ විශාල ගැටුම් ජාලාවක් ඇතුළේ ගමන් කරන්නටයි. ඔහුට ආදරය පිදූ සුගීතට මෙන්ම පූර්ණිටත් සාරධ පොදුවේ සෙනෙහස පිදිය හැකි එකම මඟ නිවන් සිත හරහායි. මොකද? නිවන් සිත තුළත් මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා මිස රාග, ද්වේශ, මෝහයන්ට ඉඩ දීමක් නෑ. එනිසා රාගාදියෙන් මිදුන සෙනෙහසක් දිය හැකි එකම මඟ එයයි. ඒත් තිලක් අපට එය හඳුන්වන්නේ වෙන් වී යාමක් ලෙසටයි. එය එක අතකින් වෙන් වී යාමක් තමයි. රාගික සම්බන්ධාතාවෙන් වෙන් වී යාමක් එතැනින් පෙන්වන්න පුළුවන්. ඒත් ඇත්ත කතාව...........**

තිලක් සේනසිංහගේ ~~අග්නි චාමර~~ පොතේ කථා නායකයා සිවුර හැර ගිය තරුණයෙක්. ඔහු ගුරුවරයෙක් හැටියට රැකියාවට යෑමේදී විවාහයන් අර්බුද වූ තරුණියන් දෙදෙනෙකුගේ ආදරයට ලක් වෙනවා. ඒ දෙදෙනා සමඟ හොඳ හිත දුරදිග ගිහින් අවුලකට එයා පත් වෙනවා. ගැලවුමේ මඟ කුමක්ද? මේකයි කථාව.

මම තිලක් සේනාසිංහගේ අග්නි චාමර කියවන්න පටන් ගත්තේ තරමක අවිශ්වාසයෙන්. මොකද? මේ වගේ කථා සමාජ අර්ථයක්වත් නැත්නම් දර්ශන අර්ථයක්වත් දෙන්නේ නැත්නම් ඒවා කියවන එකත් කම්මැළිකමක්. කලා රසය වෙනුවෙන්ම යොමුවෙන්න මට ඇති කාලය සීමිතයි. ඒත් බමුණුගම සාදුත් හොඳයි කියල තිබුණ නිසා මං කියවීම ආරම්භ කළා. මටත් පුදුමයි එය අඩියෙන් අඩිය මාව ලොකු ගැඹුරකට අරන් ගියා. ගැහැණිය හා පිරිමියා අතර ප්‍රේම සම්බන්ධය ඇත්තටම තෘෂ්ණාවේ වෙළීමක් පමණක්ද? නැත්නම් වෙන අධ්‍යාත්මික අර්ථයක් තියෙනවද? මේ ගැන එංගල්ස් කියල තියෙන්නේ දෙදෙනෙක් තමන් අතර වෙනත් අයගෙන් වෙන්වුන ආදරයකට බැඳීම මනුෂ්‍ය අත්දැකීමක් හැටියටයි. ප්‍රජනනය පැත්තෙන් බැළුවහොත් පිරිමියෙක් මෙලෙසට අන් අයගෙන් වෙන් කරන බැඳ ගැනීමෙන් මවකගේ රාජකාරිය ලිහිල් වෙනව. පිරිමියෙක් ආදර බැම්ම නිසාම දරුවා වෙනුවෙන් කරන කැප වීමට හවුල් කරගන්නට පුළුවන් වෙනව. ඒත් එයට මීට වඩා මූර්ත අර්ථයක් දෙන්නටත් පුළුවන් විය යුතුයි. යථාවාදීව වුණත් එවැනි සාරධර්මයන් ගැන සලකන්න පුළුවන්. මට පෙනී ගියේ මේ කථාව තුළ මේ ප්‍රශ්නය ගැන යමක් වැදගත් ලෙස ඉදිරිපත් වෙන බවයි.

බුදුන් යසෝදරාවන් සහ දරුවා අමතක කරල නිවන් සොයා ගියා. ඒ අනුව ලෝක විෂය ගැන හේතු උත්පාද දැනීම ලබා ගැනීමට හා එය අන් අයට පහදා දෙන්නට ඉඩ ලබා ගත්තා. ඒ වුණත් මේ දර්ශනවාදී ජයග්‍රහනය වෙනුවෙන් දරු පවුල දමා ගිය ගමන සදාචාරවාදීද? තම ආදරය අමතක කිරීම හා ඒ අය දුකට දැමීම හරිද? ඒත් අනෙක් අතට බුදුන් තම ප්‍රබුද්ධ චින්තනයත් සමඟ ආපසු තම ගම් පලාතට ඇවිත් දරු පවුලත් දෙමාපියනුත් මුණ ගැහෙනව. ඒ විතරක් නෙවෙයි අවසානයේදී රාහුල හා යසෝදරාවන් මෙන්ම ප්‍රජාපති ගෝතමී මැණියත් බුදුන්ගේ පවුලට යළි එකතු වෙනව. දැන් බුදුන්ගේ දර්ශනය තුළ පෙළ ගැසුන පවුල සංඝ සභාවයි. එම සභාව තුළට මේ අය ඇතුළත් කර ගැනීමෙන් ඔවුන් යළි තම සගයන් බවටම පත් කරගන්නව. සිදුහත් හැටියට ඔහුට තිබුණේ ඒංගල්ස් කියන ආකාරයේ සාමාන්‍ය ආදරය. එය තෘෂ්ණාව මැදි කරගත් දෙයක් මිස තෘෂ්ණාව යටපත් කරගත් දෙයක් නෙවෙයි. එය ඊර්සියාව හා නතු කරගැනීම මත පදනම් වන සාමාන්‍ය ආදරයයි. එහෙත් බුදුන්ගේ නව පවුල, එනම් සංඝ සමාජය, අළුත්ම එකමුතු වීමක්. තෘෂ්ණාව යටපත් කර මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන උසස්ම සෙනෙහස මත පදනම් වූ සමාජ පවුලක්. අද ධනපති සමාජයේ සංඝ සමාජය මෙලෙසට මේ උතුම් සෙනෙහස උඩම හැදිලා නෑ. ඇත්ත. ඒත් එහි දෘෂ්ඨිය එම අරමුණයි. එදා බුදුන් පෙන්වා දුන්නේ තමන්ගේ පැරණි සෙනෙහස වෙනුවට මේ නිවන් සෙනෙහස තුළ යළි එදා තම දරුවාට, බිරිඳට පමණක් නොව මෑණියන් ඇතුළු සියළු නෑදෑයන්ට එක් විය හැකි බවයි. පැරණි පවුල් සමාජයෙන් කඩල තම අළුත් සමාජයට ඇදගෙන යන විට සුද්ධෝධන පියතුමාට එය ඉවසගන්න බැරිව ඇවිත් බුදුන්ගෙන් වරමක් ගත්ත උපක්‍රමවලින් ඔවුන් තම වංශයෙන් ගෙනියන එක නවත්වන ලෙසට. පීතෘමූලික සමාජය සමඟ ගැටුම එතැනදී මතු වුණා.



කොහොම වුණත් සිදුහත් - යසෝදරා ප්‍රේමය මෙලෙසට බුදුන් හා යසෝදරා ථෙරණිය ලෙසට සංඝ සභාව තුළත් නිෂේධ වුණා කියලත්, එසේම උතුම් බැම්මකට යළි ඇතුල් වුණා කියලත් කියන්න පුළුවන්. මට හිතුනේ මේ ගැටලු මේ තිලක් ගේ කථාව තුළින් දැඩි ලෙස මතු වෙනව කියලයි. තෘෂ්ණාව මූල් වූ ආදරය තුළින් කටුක අත්දැකීමකට සාරධ මුහුණ දෙනව. ඔහු තම සිත තුළ අරගල කරන්නේ ආත්මාර්තකාමී නොවී සාමූහික ආදරයකින් සමාජය සමඟ ජීවත් වෙන්න. ඒත් එයින් ඔහුට ඇති වුණේ විශාල ගැටුම් ජාලාවක් ඇතුළේ ගමන් කරන්නටයි. ඔහුට ආදරය පිදූ සුගීතට මෙන්ම පූර්ණිටත් සාරධ පොදුවේ සෙනෙහස පිදිය හැකි එකම මඟ නිවන් සිත හරහායි. මොකද? නිවන් සිත තුළත් මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා මිස රාග, ද්වේශ, මෝහයන්ට ඉඩ දීමක් නෑ. එනිසා රාගාදියෙන් මිදුන සෙනෙහසක් දිය හැකි එකම මඟ එයයි. ඒත් තිලක් අපට එය හඳුන්වන්නේ වෙන් වී යාමක් ලෙසටයි. එය එක අතකින් වෙන් වී යාමක් තමයි. රාගික සම්බන්ධාතාවෙන් වෙන් වී යාමක් එතැනින් පෙන්වන්න පුළුවන්. ඒත් ඇත්ත කතාව ගිහි බැඳීම්වලින් මිදුනත් මිනිසුන් වෙන් විය යුතු නැහැ. එදා සිදුහත් යසෝදරාගෙන් වෙන් වුණත් පිවිතුරු හේතු උත්පාද යථාවාදී දර්ශන රාමුවක නැවත එක් වුණා. "මම ඔයාගේ දරු පැටියවත් කර පින්නගෙන එක මොහොතකට හරි ඔයා ළඟට එන්න බලන්නම්." යන සුගීතගේ අන්තිම වදන යසෝදරාගේ මුල් පැතුමට එක විදියකින් සමානයි. ඒත් ඇත්තටම යසෝදරා මෙන්ම රාහුල, සිදුහත්ට එකතු වුණේ නිවන් සිත් තුළින් ලැබෙන අලුත් සෙනෙහස හරහායි. එය පුද්ගලික සෙනෙහසක් නෙවෙයි. එය සියළු සතුන්ට ජීවීන්ට යොමු වුණ සෙනෙහසක්. මාක්ස් කියන විශ්ව නිර්ධන සවිඥාණය වැනි දෙයක්.

තිලක්ගේ කථාව තුළ කළු මිනිසුන් නපුරුයි, සුදු මිනිසුන් නැත්නම් පැහැපත් අය නිර්මලයි යන සාමාන්‍ය ආර්යවාදී අදහස තහවුරු කිරීම ලොකු දුර්වලකමක් හැටියට මං දකිනව. මෙය හැම සිනමාවකම පොදුවේ ජනතාවට බෙදන වැරදිම අදහසක්. එය මේ කථාවට අදාල නෑ. ඒත් එය මේ කථාව තුළින් තහවුරු කිරීම ගැන මං විරුද්ධයි. අනෙක් අතට ගැහැණිය පිරිමියට වඩා තදින් රාගිකව ඇලෙන බව පෙන්වීමත් පැරණි බමුණු මතයක් තහවුරු කිරීමක්. සාරධ රාගික මාවතට සුගීතා ඇද ගෙන ගියා. එසේම පූර්ණිමාත් එයටම යොමු වුණා යන අදහස තහවුරු කරලා තියෙනව. ඒත් ඇත්තටම ගැහැණිය කාම ධේනුවක් යනුවෙන් හැඳින්වීම ඇත්ත වසන් කිරීමක්. ගැහැණිය හා පිරිමියා අතර සම්බන්ධය සැහැල්ලු කාමුක මට්ටමක තැබීමට උවමනාව ඇත්තේ සාමාන්‍යයෙන් පිරිමියාටයි. ආක්‍රමණශීලීව එයට පියවර ගන්නේත් පිරිමියා මිස ගැහැණිය නෙවෙයි. ගැහැණියට හැම විටම ගැඹුරු සම්බන්ධතාවක අවශ්‍යතාවය තියනව. එය ප්‍රජනනයේ පැත්තෙනුත් පෙනෙන දෙයක්. මේ ඇත්ත වහල ගැහැණිය චපල, කාමුක කෙනෙක් කියල දේශනා කළේ ආර්යවාදී, පීතෘවාදී බමුණන්. බුදුන් ඒ මතයට විරුද්ධව අම්මාවරුන්ගේ කැපවීම ගැන නිතර අවධාරණය කළා. ගෙදර බුදුන් අම්මා කියන පාඨය ඇති වුණේ ඒ නිසා කියලයි මං නම් හිතන්නේ.

මේ අඩුපාඩු මැදත් තිලක් අපව ගෙනියන්නේ ඉතාම ගැඹුරු ප්‍රශ්නයකට. යසෝදරා ප්‍රේමයෙන් අවසානයේ ජයගත් බවයි මං නම් හිතන්නේ. ඒ ඇය තුළ තිබුණ ප්‍රේම ගින්න යසෝදරා තෙරණිය ලෙසට නිවන් සෙනෙහසට පෙරළා ගත්ත නිසයි. සුගීතා හා පූර්ණිගේ ප්‍රේමයත් එම මාවතේම නිමාවකට යා යුතුයි. එහෙත් එවැනි විසඳුමක් මේ ධනපති සමාජය තුළ ලබා ගන්නට පුළුවන්ද? සාරධට ඇත්තටම නිවන් සිත ලබා ගන්නට නම් මුළු මිනිස් සමාජයම වෙළාගත් සෙනෙහසක් ඇති නව සමාජයක් ගොඩනගන්නට වෙනව. ඒක ආරණ්‍යයකට වෙලා බවුන් වැඩීමෙන්ම කරන්න බැහැ. සමාජය වෙනස් කිරීමේ පෙරළියට කොතන හිටියත් සම්බන්ධ වෙන්න පුළුවන්. බුදුන්ගේ කාලයටත් වඩා අද නිවන සමාජ කටයුත්තක් වෙලා.

[redacted]

Palitha (Pali)
Licenced Vehicle Tester
(RWC)

SRI LUCK AUTO P/L



Tel 9769 1617
Mob 0425 852 720
Fact 3/32 Cambria Rd
Keysborough Vic 3173

ඔබේ වාහනයේ සියළු කාර්මික
අවශ්‍යතා සඳහා දස වසරක ඇප කැපවීම

Complete Service for
Clutches
Brakes
Tune Ups
All Makes
All Models
Computer Fault Diagnosis




SRI LUCK AUTO P/L